සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

63 | S | I

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ...................................... ව්‍යවසායකත්ව අධ්‍යයනය - I කාලය : පැය 03 යි.**

වැදගත් :

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇත් 1,2,3,4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

(1) ව්‍යවසායකත්වයේ අරමුණ විය යුත්තේ,
1. උපරිම ලාභයක් ලැබීමයි.
2. තමාට මෙන්ම සමාජයට ද යහපතක් කිරීමයි.
3. ව්‍යාපාර කටයුත්ත අඛණ්ඩව පවත්වාගෙන යාමයි.
4. ව්‍යාපාරය පවත්වාගෙන යන පරිසරය ආරක්ෂා කිරීමයි.

(2) පරිසරයේ ඇති අවස්ථා හඳුනාගනිමින්, අවදානම දරාගනිමින් නිර්මාණශීලීත්වය තුළින් ව්‍යවසායකයෙකු විසින් බිහි කරන්නේ,
1.භාණ්ඩයකි. 2. සේවාවකි. 3. නිෂ්පාදිතයකි. 4. නවෝත්පාදනයකි.

(3) සහන්, සේවකයන් විසි දෙනෙකුගෙන් සමන්විත වන ඇඟළුම් කම්හලක හිමිකරුවෙකි. නවීන වර්ගයේ මහන යන්ත්‍ර 10 ක් ඔහු සතු වේ. මෙහි සඳහන් නිෂ්පාදන සාධක වර්ග ගණන,
1. 2 කි. 2. 3 කි. 3. 4 කි. 4. 5 කි.

04. පහත දැක්වෙන්නේ ව්‍යවසායකත්වය සම්බන්ධ ප්‍රකාශ කීපයකි.
A. වැරදීම් හා විවේචන වලට බිය වීමෙන් නිර්මාණශීලීත්වයට බාධා ඇති වේ.
B. වෙනත් පුද්ගලයකුගේ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ආදර්ශය තුළින් නිර්මාණශීලීත්වය වර්ධනය නොවේ.
C. ව්‍යවසායකයෙකුට නවෝත්පාදනයේ යෙදීමේ දී අවධානමකට මුහුණ දීමට සිදු වේ.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුරු තෝරන්න.
1. A හා C 2. A හා B 3. B හා C 4. A, B හා C

05. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි.
1. අනුකරණය කිරීමක්. 2. ක්‍රියාවලි අවශ්‍යතාවයක්
3. නව සොයාගැනීමක් 4. සංකලනය කිරීමක්.

06. වුවමනා පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ආහාර, නිල ඇඳුම්, ආරක්ෂාව, රූපවාහිනිය
2. ඇඳුම්, නිවාස, ප්‍රවාහනය, සන්නිවේදනය
3. ඇඳුම්, තට්ටු නිවාස, දුම්රිය, දුරකතනය
4. නිල ඇඳුම්, මහල් නිවාස, රසකැවිලි, අන්තර්ජාලය

07. ''සේවාවක්'' යන්නට ගැලපෙන පිළිතුර වන්නේ,
   1. මිලක් නොගෙවා අවශ්‍යතා ඉටු කර ගැනීමකි.
   2. පාරිභෝගිකයාට අවශ්‍ය නොවන නිෂ්පාදන ක්‍රියාවලියකි.
   3. භෞතික පැවැත්මක් නොමැති නිෂ්පාදන ක්‍රියාවලියකි.
   4. සමජාතීය බව ආරක්ෂා කළ හැකි නිෂ්පාදිතයකි.

08. ඕනෑම ව්‍යාපාර ආයතනයකට පොදු ලක්ෂණයක් වන්නේ,
   1. ලාභ අරමුණින් පැවතීම.
   2. අවදානමක් පැවතීම.
   3. වෙළඳපොළේ අඛණ්ඩව රැඳී සිටීම.
   4. තරඟය සොයා යෑම.

09. ප්‍රධාන වෛද්‍යවරයා ලෙස කටයුතු කරන වීරසේකර මහතා ඉතා අඩු පහසුකම් පැවති රෝහල, ප්‍රදේශයේ ධනවතුන්ගේ හා රජයේ සහය ලබා ගනිමින් ඉතා ප්‍රියමනාප හා ප්‍රමාණවත් පහසුකම් සහිත රෝහලක් බවට පත්කිරීමට කෙටි කලකදී සමත් විය. වීරසේකර මහතා හැඳින්විය හැක්කේ,
   1. සමාජීය ව්‍යවසායකයෙකු ලෙස ය.
   2. අභ්‍යන්තර ව්‍යවසායකයෙකු ලෙස ය.
   3. ව්‍යාපාර ව්‍යවසායකයෙකු ලෙස ය.
   4. ලාභ ලබන ව්‍යවසායකයෙකු ලෙස ය.

10. ව්‍යාපාරයක් අතිශයින් සාර්ථක වන විට සමාජයෙන් ව්‍යවසායකයෙකුට ලැබෙන ප්‍රතිලාභයක් ලෙස සැලකිය නොහැක්කේ,
   1. වෘත්තීමය වශයෙන් ස්ථාවර වීම.
   2. සමාජීය නායකත්වය හිමි වීම.
   3. කීර්තිය හා ප්‍රසංශාව හිමිවීම.
   4. සමාජයේ පිළිගැනීමට ලක්වීම.

11. ව්‍යාපාරයක අරමුණු ඉටුකරගැනීමට සේවකයන් මෙහෙයවීම හා පෙළඹවීම අයත්වන්නේ,
   1. කළමනාකරුගේ භූමිකාවට ය.
   2. අයිතිකරුගේ භූමිකාවට ය.
   3. පරිපාලකයෙකුගේ භූමිකාවට ය.
   4. නායකයෙකුගේ භූමිකාවට ය.

12. කුඩා පරිමාණ ව්‍යාපාරයක දැකිය හැකි ලක්ෂණයකි.
   1. වෙළඳපොළ ව්‍යාප්ත වී පැවතීම.
   2. පොදු හිමිකාරිත්වයක් පැවතීම.
   3. ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතු වීම.
   4. අධ්‍යක්ෂක මණ්ඩලයක් විසින් පාලනය කිරීම.

13. කුඩා ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි.
   1. විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගැනීම.
   2. වෙළඳපොළ හැකිතාක් පුළුල් කිරීම.
   3. පවුලේ සාමාජිකයන්ගේ සහය ලබා ගැනීම.
   4. යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම.

14. තම සේවකයන්ගේ පෞද්ගලික ගැටළු විසඳීම සඳහා ව්‍යවසායකයෙකු සතු විය යුතු කුසලතාව,
   1. සංකල්පනාත්මක කුසලතාවයි.
   2. සන්නිවේදන කුසලතාවයි.
   3. උපදේශන කුසලතාවයයි.
   4. තාක්ෂණික කුසලතාවයි.

15. ව්‍යාපාරයක පවත්නා සම්පත් එම ව්‍යාපාරයේ,
   1. ආසන්න පරිසර සාධකයකි.
   2. අභ්‍යන්තර පරිසර සාධකයකි.
   3. ප්‍රජා පරිසර සාධකයකි.
   4. ආර්ථික පරිසර සාධකයකි.

16. සේවා නියුක්තිය හා විද්‍යුත් මුදල් භාවිතය පිළිවෙළින් අයත්වන පරිසර සාධක වන්නේ,
   1. නෛතික පරිසරය හා ආර්ථික පරිසරය
   2. ආර්ථික පරිසරය හා ගෝලීය පරිසරය
   3. ආර්ථික පරිසරය හා තාක්ෂණික පරිසරය
   4. ආසන්න පරිසරය හා නෛතික පරිසරය

17. ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය ඇතුලත් වන්නේ,
   1. ප්‍රාථමික අංශයට ය.
   2. ද්විතියික අංශයට ය.
   3. තෘතියික අංශයට ය.
   4. කෘෂිකාර්මික අංශයට ය.

18. රජය විසින් කුඩා ව්‍යාපාරිකයන්ගෙන් අයකරන බදු අඩු කිරීම එම ව්‍යාපාර වලට,
   1. ශක්තියකි.
   2. දුර්වලතාවයකි.
   3. අවස්ථාවකි.
   4. තර්ජනයකි.

19. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ගතයුතු තීරණ අතරට අයත් නොවන තීරණයක් වන්නේ,

1. ඉපයීම් ප්‍රමාණවත් ද?
2. ඉලක්ක පාරිභෝගිකයා කවුද?
3. තරඟයේ ස්වභාවය කෙබඳුද?
4. අවසන් කිරීම පහසු ද?

20. තරඟකාරීත්වය අධ්‍යයනයේදී දැනට සිටින තරඟකරුවන්ට අමතරව අවදානය යොමුකල යුතු අනෙක් පාර්ශවය වන්නේ,

1. පාරිභෝගිකයන් ය.
2. අතීතයේ සිටි තරඟකරුවන් ය.
3. අනාගතයේ පිවිසිය හැකි තරඟකරුවන් ය.
4. අනාගතයේ පිවිසිය හැකි ආයෝජකයන් ය.

21. නව ව්‍යාපාරිකයෙකුට ප්‍රාග්ධනය සපයාගත හැකි මාර්ගයක් නොවන්නේ,

1. ස්වකීය ඉතුරුම්
2. බැංකු ණය
3. රඳවාගත් ලාභ
4. අත්තිකාරම්

22. වාහන නවතා තැබීමට පහසුකම් සහිත හා මාර්ග පහසුකම් සහිත ජනාකීර්ණ නොවූ ස්ථානයක ස්ථානගත කිරීමට උචිත ව්‍යාපාරය වන්නේ,

1. පොත් සාප්පුවක්
2. වී ගබඩාවක්
3. වෛද්‍ය මධ්‍යස්ථානයක්
4. නිමි ඇඳුම් අලෙවිසැලක්

23. ව්‍යාපාර අදහස හා ව්‍යාපාර අවස්ථාව අතර ඇති සම්බන්ධතාව නම්,

1. ව්‍යාපාර අවස්ථාවක් ම ව්‍යාපාර අදහසක් වීමයි.
2. ව්‍යාපාර අවස්ථාව තුලින් ව්‍යාපාර අදහස ජනිත වීමයි.
3. සෑම ව්‍යාපාර අදහසක්ම ව්‍යාපාර අවස්ථාවක් වීමයි.
4. ව්‍යාපාර අදහස් තුලින් සුදුසුම අදහස ව්‍යාපාර අවස්ථාවක් වීමයි.

24. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයක් වනුයේ,

1. අවදානමක් නොමැති වීම.
2. තරඟකාරීත්වයක් නොමැති වීම.
3. අඩු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි වීම.
4. පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම.

25. ජනනය කරන ලද ව්‍යාපාර අදහස් දහස් ගණනක් අතරින් යම් යම් සාධක මතුපිටින් සලකා බලමින් අදහස් කිහිපයක් තෝරා ගැනීම සිදුවන්නේ ,

1. සාර්ව විශ්ලේෂණයේ දී ය.
2. සූක්ෂම විශ්ලේෂණයේ දී ය.
3. වෙළඳපොළ විශ්ලේෂණයේ දී ය.
4. ශුද්ධ්‍ත විශ්ලේෂණයේ දී ය.

26. නව ව්‍යවසායකයෙකුට බුද්ධිමය දේපලක් ආරක්ෂා කර ගැනීමට රජය විසින් ලබාදෙන ලියවිල්ල වන්නේ,

1. SLS ලාංඡනයයි.
2. පේටන්ට් බලපත්‍රයයි.
3. ප්‍රමිති සහතිකයයි.
4. වෙළඳ බලපත්‍රයයි.

27. ව්‍යාපාර සැලැස්මක මූලිකාංග පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.

1. නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්ම
2. අලෙවි සැලැස්ම හා වෙළඳපොළ සැලැස්ම
3. මූල්‍ය සැලැස්ම හා ගණුදෙනු සැලැස්ම
4. වෙළඳපොළ විශ්ලේෂණය හා පරිපාලන සැලැස්ම

28. භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා ඇති ඉල්ලුම පිළිබඳ තොරතුරු ඇතුලත් වන්නේ,

1. මූල්‍ය සැලැස්මේ ය.
2. අලෙවි සැලැස්මේ ය.
3. නිෂ්පාදන සැලැස්මේ ය.
4. පරිපාලන සැලැස්මේ ය.

29. විධායක සාරාංශය තුලින් ඉදිරිපත් කරන්නේ,

1. සේවක කණ්ඩායම පිළිබඳ තොරතුරු ය.
2. කළමනාකරුවන් පිළිබඳ තොරතුරු ය.
3. මුදල් ලැබීම් හා ආයෝජන පිළිබඳ තොරතුරු ය.
4. සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳ තොරතුරු ය.

30. වෙළඳපොළ විශ්ලේෂණය,
1. මූල්‍ය සැලැස්මේ පළමු පියවරයි.
2. පරිපාලන සැලැස්මේ පළමු පියවරයි.
3. අලෙවි සැලැස්මේ පළමු පියවරයි.
4. නිෂ්පාදන සැලැස්මේ පළමු පියවරයි.

31. ඉලක්ක පරිභෝගිකයා වඩාත් සුවිශේෂී ලෙස හඳුනා ගැනීම සඳහා සලකා බැලෙන සාධකයකි.
1. පාරිභෝගික ජීවන රටාව
2. පාරිභෝගිකයන් ජීවත් වන පරිසරය.
3. පාරිභෝගිකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය.
4. පාර්භෝගිකයන් ගේ අධ්‍යාපන මට්ටම.

32. පහත භාණ්ඩ යුගල අතරින් ආදේශක භාණ්ඩ යුගලය තෝරන්න.
1. පුටු - මේස
2. තේ - කෝපි
3. පෑන් - තීන්ත
4. ටයර් - ටියුබ්

33. අලෙවි මිශ්‍රය නිවැරදිව දක්වෙන පිලිතුර තෝරන්න.
1. මිල, ස්ථානය, ප්‍රවර්ධනය, වර්ධනය
2. මිල, ප්‍රවර්ධනය, ප්‍රචාරණය, ස්ථානය
3. නිෂ්පාදිතය, මිල, ප්‍රචාරණය, වර්ධනය
4. නිෂ්පාදිතය, මිල, ස්ථානය, ප්‍රවර්ධනය

34. පහත දෑ අතරින් අලෙවි ස්ථාවර වත්කමක් ලෙස සැලකිය හැක්කේ,
1. බෙදාහැරීමේ වෑන්රථ
2. යන්ත්‍ර සූත්‍ර
3. අමු ද්‍රව්‍ය
4. ඉඩම් හා ගොඩනැගිලි

35. අපේක්ෂිත අලෙවි ඒකක ප්‍රමාණය ඒකකයක අපේක්ෂිත විකුණුම් මිලෙන් ගුණකිරීමෙන් ගණනය කරගත හැක්කේ,
1. අලෙවි ආදායමයි.
2. අපේක්ෂිත ශුද්ධ ලාභයයි.
3. අපේක්ෂිත දළ ලාභයයි.
4. අපේක්ෂිත අලෙවි ආදායමයි.

- ''රන්සිරිගම'' ජනගහනය 40 000 වන අතර ඔවුන්ගෙන් 25% ක් දිනකට යෝගට් 1 ක් ආහාරයට ගනී. දැනට ප්‍රදේශයේ යෝගට් සැපයුම වන්නේ දිනකට යෝගට් 8000 කි.

36. ඉහත සිද්ධියට අනුව ඉලක්ක කණ්ඩායම,
1. 8 000 කි.
2. 10 000 කි.
3. 20 000 කි.
4. 40 000 කි.

37. රන්සිරිගම ප්‍රදේශයේ දෛනික යෝගට් ඉල්ලුම වන්නේ,
1. 8 000 කි.
2. 10 000 කි.
3. 15 000 කි.
4. 20 000 කි.

38. රන්සිරිගම යෝගට් වෙළඳපොළේ වෙළඳපොළ හිදැස කොපමණ ද?
1. 10 000 කි.
2. 8 000 කි.
3. 5 000 කි.
4. 2 000 කි.

39. ස්වාධිකාර හිමිකම ලබාදෙන රාජ්‍ය ආයතනය වන්නේ,
1. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයයි.
2. ජාතික බුද්ධිමය දේපල කාර්යංශයයි.
3. බුද්ධිමය දේපළ සුරැකීමේ සංගමයයි.
4. බුද්ධිමය දේපළ බලපත්‍ර ආයතනයයි.

40. ව්‍යවසායකයෙකු විසින් නිරතුරුව දරන අවදානමට ප්‍රධානම හේතුව වන්නේ,
1. දැඩි ආශාවයි.
2. අවිනිශ්චිතතාවයි.
3. සාමාන්‍ය වැටහීමයි.
4. ස්වයං පෙළඹවීමයි.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 63 | S | I |
| --- | --- | --- |

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය :** ..................................... **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II**

වැදගත් :

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

(01) පහත සිද්ධිය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසල් කාලයේ සිට ම වෙනස් දෙයක් කිරීමට උනන්දුවක් දක්වූ රුවන් ඒකනායක මහතා වර්තමානයේ ශරීර සෞඛ්‍ය නිරෝගීව පවත්වාගෙන යාමට උනන්දුවන පුද්ගලයන් සඳහා දේශීය කුළුබඩු භාවිතයෙන් නිපදවන ශරීරයේ මේදය දහනය කිරීමට උදව්වන බීම වර්ගයක් හඳුන්වාදීමට අපේක්ෂාවෙන් සිටී. ඔහු ජීවත්වන කාර්ය බහුල නාගරික පරිසරයේ ඒ සඳහා විශාල ඉල්ලුමක් පවතින බව ඔහු විසින් කරන ලද පරිසර විශ්ලේෂණය තුළින් හඳුනා ගන්නා ලදී. එම ප්‍රදේශයේ ජනගහනය 60,000 ක් පමණ වන අතර එයින් 30% ක් පමණ ඔහුගේ නිෂ්පාදිතය මිලදී ගනී යයි විශ්වාස කෙරේ. ව්‍යාපාරය සඳහා රු. 600,000 ක් වටිනා ඔහු සතු ගොඩනැගිල්ල ද රු. 500,000 ක් වටිනා ලොරි රථය ද, රු.150,000 ක් වටිනා යන්ත්‍රයක් ද භාවිත කිරීමට අපේක්ෂා කරයි.

තව ද වර්ෂයක කාලයක් සඳහා පහත වියදම් දැරීමට නියමිත ය.

| | |
| --- | --- |
| * ලොරි රථ ක්ෂය | රු. 5 000.00 |
| * රක්ෂණ වාරික | රු. 2 500.00 |
| * ප්‍රචාරණයට | රු. 10 000.00 |
| * අලෙවි සේවක වැටුප් | රු. 20 000.00 |
| * ඉන්ධන හා අළුත්වැඩියා | රු. 4 000.00 |

එක් බීම බෝතලයක් රු. 150.00 ක මුදලකට අලෙවි කිරීමට නියමිත වේ.

ඉහත සිද්ධිය ඇසුරින් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) රුවන් මහතා සතු ව්‍යවසායකත්ව ගුණාංග 02 ක් දක්වන්න.
ii) ඔහු විසින් ඉලක්ක කරනු ලැබ ඇති පාරිභෝගික කණ්ඩායම සඳහන් කරන්න.
iii) මෙම නිෂ්පාදනය සඳහා නමක් යෝජනා කරන්න.
iv) ඔහු විසින් භවිතා කරන අලෙවි ස්ථාවර වත්කම් 02 ක් නම් කරන්න.
v) රුවන් මහතාට සිටිය හැකි තරගකරුවන් 02 ක් නම් කරන්න.
vi) මෙහි ඉලක්ක වෙළඳපොළ කොටස ගණනය කරන්න.
vii) ඔහු විසින් ලබාගැනීමට අපේක්ෂිත අලෙවි ආදායම ගණනට කරන්න.
viii) ඔහුගේ අපේක්ෂිත අලෙවි වියදම ගණනය කරන්න.
ix) රුවන් මහතාට තම නිෂ්පාදිතය සඳහා ලබාගත හැකි නීතිමය රැකවරණය සහිත ලියවිල්ල කුමක්ද? එහි වලංගු කාලය වසර කීයද?
x) ඔහුට මුහුණ දීමට සිදුවන අවස්ථාවක් හා තර්ජනයක් ලියන්න.

(02) i) අනෙකුත් නිෂ්පාදන සාධකවලට සාපේක්ෂව ව්‍යයසායකත්වයෙහි ඇති සුවිශේෂී වැදගත්කම කුමක්ද?

ii) ඔබ පාසලේ පවතින ගැටලුවක් ලියා ඒ සඳහා නිර්මාණාත්මක විසඳුමක් ලියන්න.

iii) නිර්මාණශීලීත්වය අගය කල හැකි ආකාර 02 ක් ලියන්න.

iv) නවෝත්පාදනය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

v) දිගුවක් හා අනුකරණය කිරීමක් සඳහා උදාහරණය බැගින් ලියන්න.

(03) i) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

ii) අධ්‍යාපනය හා සන්නිවේදනය යන අවශ්‍යතා 02 සඳහා වුවමනා 02 බැගින් දක්වන්න.

iii) ව්‍යාපාරවල පැවතිය හැකි ප්‍රධාන අරමුණු 02 සඳහන් කරන්න.

iv) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර සමානකම් 04 ක් සඳහන් කරන්න.

v) ව්‍යාපාර ව්‍යවසායකයා හා සමාජයීය ව්‍යවසායකයා අතර වෙනස පහදන්න.

(04) i) ව්‍යවසායකත්වය තුළින් ව්‍යවසායකයාට අත්වන ප්‍රතිලාභ 04 ක් ලියන්න.

ii) කුඩා පරිමාණ ව්‍යාපාරවල හඳුනාගත හැකි ගති ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

iii) කුඩා පරිමාණ ව්‍යාපාරවල ශක්තීන් යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

vi) ව්‍යවසායකයෙකු විසින් කළමනාකරුවෙකුගේ භූමිකාව තුල ඉටු කරන කාර්යයන් 02 ක් දක්වන්න.

v) ව්‍යාපාරවල අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය අතර වෙනස්කම් 02 ක් සඳහන් කරන්න.

(05) i) ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ 03 න් 02 ක් සඳහා උදාහරණ 02 බැගින් ලියන්න.

ii) ව්‍යාපාර ස්ථානයක් පිහිටුවීමේ දී සැලකිය යුතු සාධක 04 ක් නම් කරන්න.

iii) වෙළඳපොළට ප්‍රවේශ විය හැකි විකල්ප ක්‍රමයක් වන ''පවතින භාණ්ඩයක් පවතින වෙළඳපොළ ඉදිරිපත් කිරීම'' යන ක්‍රමයෙහි දැකිය හැකි ලක්ෂණ 02 ක් දක්වන්න.

iv) වෙළඳපොළ හිඩැසක් ලෙස හඳුන්වන්නේ කුමක්ද?

v) පහත භාණ්ඩ හා සේවාවල ඉලක්ක ගත පාරිභෝගිකයන් නම් කරන්න.

* පාසැල් බෑග් * ව්‍යායාම වැඩසටහන්
* බණ පොත් * රූපලාවන්‍ය වැඩසටහන්

(06) i) ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර වෙනස්කම් 02 ක් ලියා දක්වන්න.

ii) යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම සඳහා භාවිත කරන පියවර 02 සඳහන් කරන්න.

iii) ව්‍යාපාර සැලැස්මක ඇතුලත් විය යුතු අංග 04 සඳහන් කරන්න.

iv) මූල්‍ය සැලැස්මක ඇතුලත් විය යුතු කරුණු 02 ක් නම් කරන්න.

v) ව්‍යාපාර සැලැස්මකින් ප්‍රයෝජන ලබන පාර්ශව 02 ක් දක්වන්න.

(07) i) අලෙවි සැලැස්මක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii) අලෙවි මිශ්‍රයේ විචල්‍යයක් වන 'ස්ථානය' ලෙස හඳුන්වන්නේ කුමක්ද?

iii) තම භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය සඳහා ව්‍යවසායකයෙකුට අනුගමනය කළ හැකි උපක්‍රම 04 ක් සඳහන් කරන්න.

iv) අලෙවි ස්ථාවර වත්කම් සඳහා උදාහරණ 02 ක් නම් කරන්න.

v) පහත භාණ්ඩ සඳහා ආදේශන භාණ්ඩ ලියා දක්වන්න.

* තේ * මී කිරි * බටර් * ලී පුටු

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

63 S I,II

# පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

## ව්‍යවසායකත්ව අධ්‍යයනය - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 2 | (11) | 1 | (21) | 3 | (31) | 3 |
| (2) | 4 | (12) | 3 | (22) | 2 | (32) | 2 |
| (3) | 2 | (13) | 4 | (23) | 4 | (33) | 4 |
| (4) | 1 | (14) | 3 | (24) | 4 | (34) | 1 |
| (5) | 2 | (15) | 2 | (25) | 1 | (35) | 4 |
| (6) | 4 | (16) | 3 | (26) | 3 | (36) | 4 |
| (7) | 3 | (17) | 1 | (27) | 1 | (37) | 2 |
| (8) | 2 | (18) | 3 | (28) | 2 | (38) | 4 |
| (9) | 2 | (19) | 4 | (29) | 4 | (39) | 1 |
| (10) | 1 | (20) | 3 | (30) | 3 | (40) | 2 |

## II පත්‍රය

(01) i) නිර්මාණශීලීත්වය, පරිසර සංවේදී බව, නවෝත්පාදනය

ii) තම ශරීර සෞඛ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන පුද්ගලයන්

iii) සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න.

iv) ගොඩනැගිල්ල, ලොරි රථය, යන්ත්‍රය

v) සුදුසු තරගකරුවන් 02 ක් සඳහා ලකුණු ලබාදෙන්න.

vi) $60\ 000 \times \frac{30}{100} = 18\ 000$ කි. (පිළිතුරට ලකුණු 02)

vii) $18\ 000 \times 150$ = රු. 2700,000 කි. (පිළිතුරට ලකුණු 02)

viii) රු. 41500

ix) පේටන්ට් බලපත්‍රය, වසර 20 කි.

x) සුදුසු අවස්ථාවක් හා තර්ජනයක් සඳහා ලකුණු ලබාදෙන්න.

(02) i) අනෙකුත් නිෂ්පාදන සාධක සංකලනය කර භාණ්ඩ හා සේවා නිපදවීම පිළිබඳ තීරණ ගැනීම.

ii) සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න.

iii) මූල්‍යමය ත්‍යාග ලබාදීම, උපකාර ලබාදීම, අගය කිරීම.

iv) නව භාණ්ඩ හා සේවා උත්පාදනය කිරීමට ඇති හැකියාවයි.

v) සුදුසු පිළිතුරු 02 කට ලකුණු ලබාදෙන්න.

(03) i)

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| * මූලිකව පැන නගියි. | * අවශ්‍යතා මතු වූ පසු දෙවනුව පැන නගියි. |
| * සීමිත වේ. | * එක් අවශ්‍යතාවයක් සපිරීමට වුවමනා රාශියකි. |
| * සියලු දෙනාට පොදුය. | * පෞද්ගලිකත්වය අනුව වුවමනා විවිධ වේ. |
| * උපතත් සමග ඇත්වේ. | * පුද්ගලයන්ට අවශ්‍ය පරිදි නිර්මාණය කරයි. |

ii) සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

iii) * ලාභ ලැබීමේ අරමුණ * ලාභ නොලැබීමේ අරමුණ (සුභසාධන අරමුණ)

iv) * ආර්ථික කටයුත්තක යෙදීම. * තීරණ ගැනීම. * අවදානමකට මුහුණ දීම.
* තරගයට මුහුණදීම. * ගනුදෙනුවල නිරත වීම. * පැවැත්ම ගැන සිතීම.
* සම්පත් භාවිතය * ස්වයං පෙළඹවීමක් තිබීම.

**Answer**

v) ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතු වල නිරත වන ව්‍යවසායකයින් ව්‍යාපාර ව්‍යාවසායකයින් වන අතර ලාභ අපේක්ෂාවෙන් තොරව සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මක විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝ සමාජයීය ව්‍යවසායකයින් ලෙස හැඳින්වේ.

(04) i) * ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම. * කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම.
* සමාජයීය සුභසාධනය සඳහා දායකවීම. * ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකි වීම.
* ආකර්ශණීය ලාභයක් ඉපයීම. * ස්වයංපෝෂිත බව
* වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නාවූ උපරිම අවකාශය * නිදහස හා ඉහළ තෘප්තියකට පත්වීම.

ii) * කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම. * සේවක සංඛ්‍යාව අඩුවීම. * ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම.
* ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී තීරණ ගැනීමට ඇති පහසුව.
* ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට පමණක් සීමාවීම.

iii) ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාම පිණිස යොදාගන්නා හා යොදාගත හැකි සියලුම වාසිදායක සාධක ශක්තීන් ලෙස හැඳින්වේ.

iv) * ව්‍යාපාර සැලසුම් සකස් කිරීම. * සැලසුමට අනුව කටයුතු සිදුවනවාදැයි විමසා බැලීම.

v)

| <u>අභ්‍යන්තර පරිසරය</u> | <u>බාහිර පරිසරය</u> |
|---|---|
| * ව්‍යාපාරයේ කටයුතු වලට බලපෑම් කරන ව්‍යාපාරය තුළ ඇති සාධක සියල්ල මීට අයත් වේ. | * ව්‍යාපාරයේ කටයුතු වලට බලපෑම් ඇතිකරන එහෙත් ව්‍යාපාරයට පිටතින් ඇති සියලුම සාධක මෙයට අයත්වේ. |
| * අභ්‍යන්තර පරිසරයේ ශක්තීන්, දුර්වලතා දැකිය හැක. | * අවස්ථා හා තර්ජන දැකිය හැක. |

(05) i) සුදුසු උදාහරණ සඳහා ලකුණු ලබාදෙන්න.

ii) * ගනුදෙනුකරුවන්ගේ ප්‍රමාණය සහ ඔවුන්ගේ විසිරීම. * අමුද්‍රව්‍ය ලබාගැනීමේ පහසුව
* ශ්‍රමය ලබාගැනීමේ පහසුව * යටිතල පහසුකම් ලබාගැනීමේ පහසුව
* පාරිභෝගිකයින්ට සැපයිය හැකි පහසුකම් * භූමියේ පිරිවැය

iii) * අවදානම වැඩිය. * තරඟකරුවන් රාශියකි. * ලාභ ඉපයීම අවිනිශ්චිත වේ.
* පාරිභෝගිකයා ආකර්ශනයට වැඩි වෙහෙසක් හා පිරිවැයක් දැරීමට සිදුවේ.

iv) වෙළඳපොලෙහි පාරිභෝගිකයින්ගෙන් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා සහිතව පසුවන පිරිසයි.

v) සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.

(06) i)

| <u>ව්‍යාපාර අදහස්</u> | <u>ව්‍යාපාර අවස්ථා</u> |
|---|---|
| * සුලභ වේ. | * සුලභ නොවේ. |
| * විවෘතය බොහෝ අය දකියි. | * අදහස් අතරින් අවස්ථා අනාවරණය සියල්ලන්ටම කළ නොහැකි වේ. |
| * සෑම අදහසක්ම ප්‍රායෝගික නොවේ. | * ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැක. |

ii) * සාර්ව විශ්ලේෂණය * සූක්ෂම විශ්ලේෂණය * ශදුඅත විශ්ලේෂණය

iii) * අලෙවි සැලැස් * නිෂ්පාදන සැලැස්ම * පරිපාලන සැලැස්ම * මූල්‍ය සැලැස්ම

iv) * අරමුදල් සම්පාදනය හා යෙදවීම පිළිබඳව
* ආදායම්, වියදම් හා ලාභ පිළිබඳ ඇස්තමේන්තුව

v) * අයිතිකරුවන් * ණය සපයන්නන් * කළමනාකරුවන් * ආයෝජනයන්
* සේවකයන් * තරඟකරුවන්

(07) i) ව්‍යාපාරයක අලෙවිකිරීමට අපේක්ෂිත භාණ්ඩය හෝ සේවාව, ඉලක්ක වෙළඳපොළ හා ඉලක්ක වෙළඳපොළට ළඟාවන ආකාරය දැක්වෙන ලේඛනයයි.

ii) තම භාණ්ඩය හෝ සේවාව ඉලක්ක පාරිභෝගිකයා වෙත ළඟාකර දීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ගයයි.

iii) * රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත්, බැනර්, අත් පත්‍රිකා, පෝස්ටර්
* නව තාක්ෂණය භාවිත කොට අන්තර්ජාලයේ වෙබ් අඩවි, මුහුණු පොත * SMS
* ගැණුම්කරුවන් පෞද්ගලික මුණ ගැසී භාණ්ඩ හෝ සේවා ඉදිරිපත් කිරීම.

iv) අලෙවි හා බෙදාහැරීම් කාර්යයන්වල දී භාවිතවන ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ, රථවාහන, කාර්යාල උපකරණ, ලී බඩු

v) සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබාදෙන්න.